# තෙවන ධර්ම සංගායනාව

## ❖ තෙවන ධර්ම සංගායනාව ඇති වීමට බලපෑ හේතු

කාලාශෝක ඇවෑමෙන් ඔහුගේ පුතුන් දස දෙනකු රාජ්‍යත්වයට පත් වන අතර ඉන්පසු නන්ද රාජ පරම්පරාව බලවත් වූ අතර ඉන් පසුව චාණක්‍ය බමුණාගේ මැදිහත් වීමෙන් මෞර්ය රාජ්‍ය පෙළපත ආරම්භ විය. එහි තෙවැනියා වූ අශෝක රජු දිග් විජය ප්‍රතිපත්තිය අනුගමනය කරමින් කාලිංග යුද්ධය සිදු කරයි. මෙහි බලපෑමෙන් සිත් තැවුලට පත් අශෝක රජු බෞද්ධයකු වී සුවිශේෂී අනුග්‍රාහකත්වයක් සැපයූ බැවින් මිත්‍යා දෘෂ්ටිකයින් සසුන් ගතව එහි අරාජිකත්වයක් ගොඩ නැගේ, අවුරුදු 07 ක් තිස්සේ සංඝකර්ම සිදුනොවේ. මේ පිළිබද සොයා බැලීමට යැවූ ඇමතිවරයකු අශෝකාරාමයේ හුන් භික්ෂූන් 12 දෙනකුගේ හිස ගසා දැමීම නිසා තත්වය තවත් බරපතල වූ අතර තමන්ට පාපයක් වේ යැයි සිතූ රජු ශාසන සංශෝධකයක් උදෙසා ධර්ම සංගායනාවක් සිදු කිරීමට තීරණය කරයි.

ඒ අනුව මෙකී ධර්ම සංගායනාවට බලපෑ හේතු ලෙසින් සඳහන්ව ඇත්තේ ..... දුසිල් මහනුන් සසුන් ගත වීම, අවුරුදු 07 ක් තිස්සේ සංඝ කර්ම විනය කර්ම නොකිරීම, සංඝ කර්ම විමසීමට යන ඇමතිවරයා භික්ෂූන් 12 ගේ හිස ගැසීම නිසා අශෝක රජු තුල ඇතිවූ බිය යනාදී හේතූන්ය.

## ❖ තෙවන ධර්ම සංගායනාව පැවැත් වූ පිළිවෙල

| | |
|---|---|
| ▪ කාලය | බුද්ධ පරිණිර්වාණයෙන් අවුරුදු 218 කට පසු<br>දෙවන ධර්ම සංගායනාවෙන් වසර 118 කට පසු |
| ▪ අනුග්‍රාහකත්වය | ධර්මාශෝක රජු |
| ▪ ස්ථානය | පැලලුප් නුවර අශෝකාරාමය |
| ▪ ප්‍රධානත්වය | මොග්ගලී පුත්ත රහතන් වහන්සේ |
| ▪ සහභාගී වූ පිරිස | රහතන් වහන්සේලා 1000 |
| ▪ ගතවූ කාලය | මාස 09 |
| ▪ සංගායනාවේ නම | සහස්සිකා මොග්ගලී පුත්ත ථේර සංගීති |

## ❖ තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල

- **දුසිල් මහණුන් හැට දහසක් සසුනින් බැහැර කරලීම**

  සියලුම භික්ෂූන් රැස් කරවා බුදුන් වහන්සේ කිනම් වාදීද ? යන්න ප්‍රශ්න කරයි, එහිදි විභජ්ජවාදී යැයි ප්‍රකාශ කල පිරිස හැර අනෙක් සියල්ලම සුදුවත් අතට දී රැකියා අවස්ථාද ලබාදී සසුනෙන් බැහැර කර ඇත.

- **මෙතෙක් නතර වී තිබූ සංඝ කර්ම විනය කර්ම නැවත ආරම්භ වීම**

- **පරවාද මත 500ක් ඛන්ඩනය කොට ස්වාවද මත 500ක් මණ්ඩන (ඉස්මතු) වන පරිදි කතාවත්ථුපකරණය සංග්‍රහ කොට අභිධර්ම පිටකය සම්පූර්ණ කිරීම**

Published on www.eduLanka.LK

මොග්ගලීපුත්ත තිස්ස හිමියන් විසින් ශාසනික දූර්මත 500 ක් බැහැර කොට නව මතවාද 500ක් ඇතුළත් කර මෙකී ග්‍රන්ථය සම්පාදනය කිරීම නිසා කොටස් 07ක් වන පරිදි අභිධර්ම පිටකය සම්පූර්ණ වීම

- *ධම්මසංගනී ප්‍රකරණය*
- *විභංග ප්‍රකරණය*
- *ධාතුකථා ප්‍රකරණය*
- *යමක ප්‍රකරණය*
- *පට්ඨාන ප්‍රකරණය*
- *කථාවත්ථුපකරණය*
- *පුග්ගල ප්‍රඥප්ති ප්‍රකරණය*

- **මෙතෙක් පැවති ද්වි පිටකය වෙනුවට සද්ධර්මය ත්‍රිපිටකයක් ලෙසින් සංගායනා වීම**

  - **නවරට සසුන් පිහිටුවීම**

| | | | |
|---|---|---|---|
| 1. | ගාන්ධාර කාශ්මීර පෙදෙස | ආසිවිසෝපම සූත්‍රය | මජ්ඣන්තික හිමි ප්‍රධාන පිරිස |
| 2. | මහිස මණ්ඩලය | දේවදූත සූත්‍රය | මහාදේව හිමි ප්‍රධාන පිරිස |
| 3. | වනවාස ප්‍රදේශය | අනමත්තග්ග සූත්‍රය | රක්ඛිත හිමි ප්‍රධාන පිරිස |
| 4. | අපරන්ත දේශය | අග්ගික්ඛන්දෝපම සූත්‍රය | යෝනක ධම්ම රක්ඛිත ප්‍රධාන පිරිස |
| 5. | මහා රාෂ්ට්‍රය | මහා නාරද කාශ්‍යප ජාතකය | මහා ධම්ම රක්ඛිත හිමි ප්‍රධාන පිරිස |
| 6. | යෝනක දේශය | කාලාම සූත්‍රය | මහා රක්ඛිත හිමි ප්‍රධාන පිරිස |
| 7. | ස්වර්ණ භූමි | බ්‍රහ්මජාල සූත්‍රය | සෝණ උත්තර දෙනම |
| 8. | හිමවන්ත ප්‍රදේශය | දම්සක් පැවතුම් සූත්‍රය | මජ්ඣිම හිමි ප්‍රධාන පිරිස |
| 9. | තම්බපන්ණිය | චුල්ල හත්ථි පදෝපම | මහා මහින්ද හිමි ප්‍රධාන පිරිස |

  - **රටවල් 18 කට ධර්මය ප්‍රචාරය කිරීම**

01. අතියොග - සිරියාවේ විසූ ඇන්තිඕකස් ග්‍රීක රජුගේ රාජ්‍යය
02. තුලමයේ - මිසරයේ ටොලමි පිලඩෙල්පාස් රජුගේ රාජ්‍යය
03. අංතෙකින් - මැසිඩෝනියාවේ ඇන්ටිගෝනස් ගොනාටස් රජුගේ රාජ්‍යය
04. චකා - බටහිර මිසරයේ මාගාස් රජුගේ රාජ්‍යය
05. අලික්‍යුෂුදලෙ - එවරස්හි ඇලෙක්සැන්ඩර් රජුගේ රාජ්‍යය
06. හිද
07. අතෙෂු
08. චෝඩ
09. පංඩියා
10. තංබ පණ්ණි
11. යෝන
12. කාංබෝජ
13. අධ
14. තාහක
15. පාලද
16. නාගපංති
17. භෝජ
18. පිතිනිත්‍ය




Published on www.eduLanka.LK

**ශ්‍රී ලංකාවේ වැඩියෙන්ම වැඩ කරන බෞද්ධ ශිෂ්ටාචාරය ක්‍රියාන්විතය .....**

- රොටරි - නුගේගොඩ
- පෙරමුතු - කලවාන
- මොන්ටානා - ගම්පහ
- වේල්ස් - මොරටුව
- සතිර - මහනුවර


**අරුණ ගුණසේකර**

ගෞරව, විශේෂවේදී උපාධිධාරී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය ඩිප්ලෝමාධාරී


- ජාතික රූපවාහිනියේ බෞද්ධ ශිෂ්ටාචාරය ආචාර්යය වරයා,
- දිනමිණ පුවත්පතේ බෞද්ධ ශිෂ්ටාචාරය කතුවරයා,
- ලංකාවේ වැඩිම බෞද්ධ ශිෂ්ටාචාරය සිසුන් පිරිසකට උගන්වන දේශකවරයා.

( මේ විෂයට අදාලව ලිපි නැති නිසා මෙසේ එවමි. මාගේ සුදුසුකම් ඉහතින් දක්වා ඇත්තෙමි. ඔබගේ පසු ප්‍රතිචාර අනුව ඉදිරියටත් සම්බන්ධ වෙමි. ස්තුතියි.


arunagunasekare@gmail.com
lankawehondamabcpanthiya@rocketmail.com



Published on www.eduLanka.LK